# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

## පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම

1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත පනතේ විධිවිධාන ප්‍රකාරව අංක 14853/3 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පහත තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. පුරප්පාඩු තනතුරු,**

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|
| 01 | සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | 01 | HM 1-1 | රු. 80,295 – 15 x 2,270 = 114,345/- |
| 02 | කළමනාකරු (කර්මාන්ත ශාලා) | 01 | MM 1-1 | රු. 53,175 – 10 x 1,375 – 15 x 1,910 = 95,575/- |
| 03 | කළමනාකරු (පිරිවැය) | 01 | MM 1-1 | රු. 53,175 – 10 x 1,375 – 15 x 1,910 = 95,575/- |
| 04 | කළමනාකරු (සැපයුම්) | 01 | MM 1-1 | රු. 53,175 – 10 x 1,375 – 15 x 1,910 = 95,575/- |
| 05 | සහකාර කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) | 01 | JM 1-1 | රු. 42,600 – 10 x 755 – 18 x 1,135 = 70,580/- |
| 06 | ගිණුම් නිලධාරී | 01 | JM 1-1 | රු. 42,600 – 10 x 755 – 18 x 1,135 = 70,580/- |
| 07 | සැපයුම් නිලධාරී | 01 | JM 1-1 | රු. 42,600 – 10 x 755 – 18 x 1,135 = 70,580/- |
| 08 | පරිපාලන නිලධාරී | 01 | JM 1-1 | රු. 42,600 – 10 x 755 – 18 x 1,135 = 70,580/- |
| 09 | ව්‍යාපෘති නිලධාරී | 01 | JM 1-1 | රු. 42,600 – 10 x 755 – 18 x 1,135 = 70,580/- |
| 10 | පරිගණක හා දත්ත නිලධාරී | 01 | JM 1-1 | රු. 42,600 – 10 x 755 – 18 x 1,135 = 70,580/- |

(මීට අමතරව, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.)

**02. සෑම අයදුම්කරුවෙක්ම,**

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**03. බඳවා ගැනීමේ ක්‍රමය,**

I. පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් සංස්ථාවේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවාගනු ලැබේ.

II. සේවක අර්ථසාධක අරමුදලට පත්වීම්ලාභීන්ගෙන් 8% ක් ද සේවා යෝජකයාගෙන් 12% ක් වශයෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට පත්වීම්ලාභියාගේ වැටුපෙන් 3% කට සමාන මුදලක් ගෙවනු ලැබේ.

04. **අයදුම් කල යුතු ආකාරය,**

I. ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ දී සළකා බලනු ලබන සුදුසුකම් හා ඊට අදාළ සියලු විස්තර ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ **www.sladc.lk** යන නිල වෙබ් අඩවියට ප්‍රවේශ වීමෙන් ලබාගත හැකිය.

II. පුවත්පත් දැන්වීමට අනුව නිල වෙබ් අඩවියේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය මඟින් තනතුර සඳහා අයදුම් කල යුතු අතර, අයදුම් පත්‍රයේ සඳහන් සුදුසුකම් සනාථ කිරීමේ සහතික පත්‍රවල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

III. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යාස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය.

IV. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

V. ඉහත තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් වෙන වෙනම අයදුම් කළ යුතුය.

VI. අයදුම්පත් භාරගැනීම 2025.03.24 දිනෙන් අවසන් වන අතර, නිසි පරිදි අයදුම් කරන ලද අයදුම්පත් එදිනට හෝ එදිනට පෙර **සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.** යන ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන්** එවිය යුතුය.

VII. තවද ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, මූලික සුදුසුකම් සපුරා නොමැති හා මූලික සුදුසුකම් සපුරා ඇති බවට සහතික පිටපත් මඟින් සනාථ කර නොමැති, නිසි පරිදි ඉදිරිපත් නොවූ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VIII. තැපැලෙන් අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප සංස්ථාව වගකියනු නොලැබේ.

සැ.යු - අයදුම්පත් බාරගන්නා අවසන් දිනය හෝ ඉහත බඳවා ගැනීමට අදාළ වෙනත් කරුණක් සම්බන්ධයෙන් යම් සංශෝධනයක් සිදුවුවහොත් නිල වෙබ් අඩවියේ ඒ බව යාවත්කාලීන කරණු ඇත.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව,**
**නාවින්න, මහරගම**
2025.03.06